# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 65 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 දෙසැම්බර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 3.50 යි. තැපැල් ගාස්තුව : රු.3.50 යි.

## 1998 අංක 65 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 28 වන දින.]

එල්. ඩී.–ඕ. 12/96.

### වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1998 අංක 65 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 12 වන වගන්තිය අවසානයේ දී පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

1983 අංක 24 දරන පනතේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "එසේ වුවද, වයසින් අවුරුදු විසි එකක් වූ හෝ ඊට වැඩි වූ පිරිමි අනත්දරුවකු හෝ අවිවාහක ගැහැණු අනත්දරුවකු හෝ රැකියා විරහිතව සිටින තාක් කල් ඔහු හෝ ඇය වයසින් අවුරුදු විසි හය වනතුරු විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—D 049844—5,900 (98/09)

පාර්ලිමේන්තුවේ සිංහල පතත් කෙටුම්පත්වල සහ පතත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.